ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
அனர்த்த முகாமைத்துவ அமைச்சு
MINISTRY OF DISASTER MANAGEMENT
විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව.
வித்யா மாவத்தை, கொழும்பு 07, இலங்கை.

| අමාත්‍ය / அமைச்சர் / Minister | ෆැක්ස් / பக்ஸ் / Fax | ලේකම් / செயலாளர் / Secretary | ෆැක්ස් / பக்ஸ் / Fax | ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / General Office 0112-665170 | ෆැක්ස් / பக்ஸ் / Fax |
|---|---|---|---|---|---|

| මගේ අංකය / எனது இல / My No. | NDRSC/02/04/05/01 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி | 2018.01.11 |
|---|---|---|---|---|---|

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,**

**<u>ආපදා අවස්ථාවන්හිදී රාජකාරී කටයුතුවල නියුතු වූ රජයේ නිලධාරින් සඳහා දීමනා ගෙවීම</u>**

ආපදා අවස්ථාවන්හිදී රාජකාරී කටයුතුවල නියුතු වූ රජයේ නිලධාරින් සඳහා දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක අමප/17/2945/715/023-I හා 2018.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා බැඳේ.

02. ඒ අනුව ආපදා අවස්ථාවන්හිදී රාජකාරීවල නියුතුවූ පහත සඳහන් වැටුප් කාණ්ඩ හිමි රජයේ නිලධාරින් හට මූලික වැටුපෙන් 1/3ක දීමනාවක් 2016 හා 2017 වර්ෂ සඳහා ගෙවීමට මෙම උපදෙස් නිකුත් කරනු ලැබේ.

| අනු අංකය | වැටුප් කාණ්ඩය | දීමනාව |
|---|---|---|
| 01 | SL2/HM2-3 | ආපදා අවස්ථාවන්හිදි මුදවාගැනීම, සහන, පුනරුත්ථාපන රාජකාරී ඉටුකළ මෙම වැටුප් කාණ්ඩවලට අයත් නිලධාරින් සඳහා මූලික වැටුපෙන් 1/3ක දීමනාවක් ලෙස ලබාදීමට |
| 02 | SI-1/MM-1-1/HM-1-3/HM-1-1/AR-2 | |
| 03 | MN-7/JM-1-1 | |
| 04 | MN-7 කාණ්ඩයේ හැර අනෙකුත් MN කාණ්ඩයේ වැටුප් දරණ නිලධාරින්ට | |
| 05 | MA-1-1/MA-2-1/MA-3 | |
| 06 | PL | |

03. ඉහත දීමනාව ලබාදිය යුත්තේ පහතින් සඳහන් කරනු ලබන ආපදා අවස්ථාවන්වලදී හා ආපදා කාලසීමාව තුලදී මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරී කටයුතුවල නියුතුවූ නිලධාරින් සඳහා ය.

| අනු අංකය | ආපදා අවස්ථාව | දීමනාව හිමි වර්ෂය හා මාසය | දීමනාව හිමි දිස්ත්‍රික්ක |
|---|---|---|---|
| I | 2016 මැයි මස ඇතිවූ ගංවතුර හා නායයෑම | 2016 වර්ෂයේ මැයි,ජූනි මාස | කොළඹ, ගම්පහ, කළුතර, පුත්තලම, කුරුණෑගල, රත්නපුර, කෑගල්ල, මහනුවර, මඩකලපුව, මුලතිව්, යාපනය, මන්නාරම, කිළිනොච්චි |
| II | 2016.06.05 දින සාලාව යුධ හමුදා කඳවුරේ අවිගබඩාව පිපිරීම | 2016 වර්ෂයේ ජූනි,ජූලි මාස | කොළඹ |
| III | 2017 මැයි මස ඇතිවූ ගංවතුර හා නායයෑම | 2017 වර්ෂයේ ජූනි,ජූලි මාස (මැයි මස 24 දින සිට 31 දක්වා රාජකාරී කළ කාලයද ජූනි මස 1/3ක දීමනාව ලබාදීම සඳහා ගණනය කළ හැක) | ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ, කළුතර, රත්නපුර, කෑගල්ල |
| IV | 2017.04.14 දින මීතොටමුල්ල සන අපද්‍රව්‍ය බහාලුම් ස්ථානය නායයෑම | 2017 වර්ෂයේ අප්‍රේල් මාසය | කොළඹ |
| V | 2017.11. 29 දින ඇතිවූ අධික සුළං,ගංවතුර හා නායයෑම | 2017 වර්ෂයේ දෙසැම්බර් මාසය (නොවැම්බර් මස 29, 30 යන දිනයන්හි රාජකාරී කළ කාලයද දෙසැම්බර් මස 1/3 දීමනාව ලබාදීම සඳහා ගණනය කළ හැක) | ගාල්ල, මාතර, කොළඹ, කළුතර, ගම්පහ, බදුල්ල |

04. ඉහත 3 යටතේ සඳහන් කරන ලද ආපදාවන් සිදු වූ දින සිට එය කඩිනමින් යථා තත්ත්වයට පත්කිරීම සඳහා ගතවූ කාල සීමාව තුළ තම නිත්‍ය රාජකාරී වේලාවන්වලට අමතරව මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන කටයුතුවල නිරත වූ රාජ්‍ය නිලධාරීන් සඳහා පමණක් මෙම දීමනාව ලබාදිය හැක.

05. අංක 3 යටතේ සඳහන් කර ඇති ආපදා අවස්ථාවන්වලදී කාර්යාලයේ හෝ ක්ෂේත්‍රයේ මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරීන්වල යෙදී ඇති නිලධාරීන් සඳහා මෙම 1/3ක දීමනාව එක් මාසයක් සඳහා ගෙවීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

05.01. ආපදාව සිදුවූ දින සිට තම නිත්‍ය රාජකාරීන්වලට අමතරව දිනකට පැය 04කට නොඅඩු කාලයක් අවම වශයෙන් අදාළ මාසයේ සතියේ වැඩකරන දින 10ක් මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරීන් සඳහා යෙදීම

හෝ

05.02. ආපදාව සිදුවූ දින සිට සති අන්ත හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දින 05ක් අවම වශයෙන් මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරීන්වල යෙදීම

06. ජාතික ස්වාභාවික ආපදා සඳහා වූ රක්ෂණාවරණ වැඩසටහන යටතේ දේපළ හානි තක්සේරු කිරීමේ කටයුතුවල නියැළෙන දේපළ හානි තක්සේරු කිරීමේ කමිටුවේ සාමාජිකයන් වෙත දැනටමත් රු.100ක දීමනාවක් ලබාදෙන බැවින්, මෙම 1/3ක දීමනාව ලබාදීමේදී එම නිලධාරීන් දේපළ හානි තක්සේරු කිරීමේ කාර්යය සඳහා යොදවන ලද කාලය 1/3ක දීමනාව ලබාදීම සඳහා ගණනය නොකළ යුතුය.

07. මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරී කටයුතු සිදු කිරීම වෙනුවෙන් නිලධාරීන් හට මේ වන විටත් ඉහත අංක 3හි i-v දක්වා සඳහන් කර ඇති කාලසීමාවන්ට අදාළව අතිකාල දීමනා,දින වැටුප් (1/20, 1/30 දීමනා) හෝ අනෙකුත් චක්‍රලේඛ හා උපදෙස් අනුව වෙනත් කිසියම් දීමනාවක් ගෙවා ඇත්නම් වැටුපෙන් 1/3ක දීමනාවෙන් එම සියළු දීමනා අඩුකර හිඟ මුදල් ප්‍රමාණය පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය.

08. අංක 3 යටතේ සඳහන් කර ඇති ආපදා අවස්ථාවන්වලදී මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරී අවශ්‍යතාවය හෝ වෙනත් විශේෂ හේතූන් මත දිස්ත්‍රික් ලේකම්වරුන් හෝ ආයතන ප්‍රධානීන් විසින් ආපදා ඇතිවූ ප්‍රදේශ වෙත අනුයුක්ත කරන ලද රාජ්‍ය නිලධාරීන් ඉහත අංක 5 යටතේ සඳහන් කොන්දේසි සපුරන්නේ නම්, අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ මත ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත 1/3 දීමනාව ලබාදිය හැකිය.

09. ග්‍රාම නිලධාරීන් හා ග්‍රාම නිලධාරී වසම්වලට අනුයුක්ත අනෙකුත් රාජ්‍ය නිලධාරීන් හට මෙම දීමනාව ලබාදිය හැක්කේ, එම වසම් සෘජුවම ආපදාවට ලක්වී ඇත්නම් හෝ එම වසම්වල මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරී සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් එම කාලසීමාව තුළ දින 10කට නොඅඩු කාලයකට එම නිලධාරීන් රාජකාරී සඳහා යොදවා ඇත්නම් සහ ඉහත අංක 5හි සඳහන් කොන්දේසි සම්පූර්ණ කරන්නේ නම් පමණි.

10. ආපදා අවස්ථාවලදී මුදවාගැනීම, සහන හා පුනරුත්ථාපන රාජකාරී සිදුකරන ලද නිලධාරීන් වෙත මෙම 1/3ක දීමනාව ගෙවීමේදී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන් වෙත ගෙවීම් අනුමත කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම් වෙතද, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ඉහත අංක 08හි සඳහන් නිලධාරීන් වෙත ගෙවීම් අනුමත කිරීමේ බලය ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් වෙතද පැවරේ.

11. ඉහත සඳහන් උපදෙස් අනුව මෙම දීමනාව ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ සමඟ අමුණා ඇති ආකෘතිය මඟින් එක් එක් ආපදාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් කරන මෙන් කාරුණිකව දන්වන අතර ගෙවීම් කිරීමේදී ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූලව ගෙවීම් කටයුතු කරන ලෙසටත් රාජකාරී කටයුතුවල නිරත වූ නිලධාරීන් හට එම නිලධාරීන් අදාළ කාලසීමාවේදී මුදවාගැනීම, ආපදා සහන හා පුනරුත්ථාපන රාජකාරී කටයුතුවල ඵලදායී ලෙස නිරත වූ බවට ඔබ විසින් සෑහීමකට පත්වන්නේ නම් පමණක් ගෙවීම් කටයුතු කරන ලෙසටත් වැඩිදුරටත් දන්වමි.

**එම්.කිංස්ලි ප්‍රනාන්දු**
**ලේකම්**
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

**පිටපත්:**

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය -කරු.දැ.ගැ.ස.
2. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -කරු.දැ.ගැ.ස.

## ආපදා අවස්ථාවන්හිදී රාජකාරී කටයුතුවල නියුතු වූ රජයේ නිලධාරීන් සඳහා දීමනා ලබාදීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම

දිස්ත්‍රික්කය : ........................................................................................

ආපදාව: ........................................................................................

ආපදා සිදුවූ වර්ෂය හා මාසය: ....................................................................

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ..................... මාසය සඳහා | | ..................... මාසය සඳහා | | අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|---|---|---|---|
| | | නිලධාරීන් සංඛ්‍යාව | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය (රු) | නිලධාරීන් සංඛ්‍යාව | අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය (රු) | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

නිර්දේශ කළේ: අත්සන: ..................................................

දිස්ත්‍රික් ලේකම්,......................................

දිනය: ....................................................